# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1620/ 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2023

දිනය / திகதி / Date — 25/12/2023 පැය 0730

## මාධ්‍ය නිවේදනය

**01. මනුෂ්‍ය ඝාතනයක් - මාරවිල පොලිස් වසම.**

2023.12.24 වන දින රාත්‍රී කාලයේ මාරවිල පොලිස් වසමේ ගෙඩාල්ගොඩවත්ත ප්‍රදේශයේදී තියුණු ආයුධයකින් පහරදීමෙන් තුවාල ලැබූ පුද්ගලයෙකු මාරවිල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට මාරවිල පොලිසියට ලද පණිවිඩයකට අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 34 ක් වන ජනහිතගම, පහල නාත්තන්ඩිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු විසින් රූපවාහිනී යන්ත්‍රයක් සහ ජංගම දුරකථනයක් පුද්ගලයකුට උකස් කර තිබූ අතර, එය නැවත බේරා ගැනීමට ගිය අවස්ථාවේදී ඇතිවූ බහින්බස්වීමක් හේතුවෙන් පුද්ගලයන් දෙදෙනෙකු විසින් තියුණු ආයුධවලින් පහරදී ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය මාරවිල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර, මනුෂ්‍ය ඝාතනයට සම්බන්ධ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා මාරවිල පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. මාරක රිය අනතුරක් - වෙල්ලවීදිය පොලිස් වසම.**

2023.12.24 වන දින දහවල් කාලයේ වෙල්ලවීදිය පොලිස් වසමේ බෝධිරාජ අඩි 100 පාර කොළඹ නගරය දෙසට ධාවනය වූ පුද්ගලික බස් රථයක් මගීන් ගැනීමට නවතා නැවත ඉදිරියට ධාවනය කිරීමේදී පදික වේදිකාවේ සිට මාර්ගය පැමිණි පදික පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පුද්ගලයා කොළඹ ජාතික රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 59 ක් වූ කැලණිමුල්ල, අංගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. වෙල්ලවීදිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - මිහින්තලය පොලිස් වසම.

2023.12.24 වන දින අළුයම් කාලයේ මිහින්තලය පොලිස් වසමේ අනුරාධපුරය යාපනය මාර්ගයේ වැලිඔය හන්දිය අසලදී අනුරාධපුර දෙස සිට යාපනය දෙසට ධාවනය වූ පුද්ගලික බස් රථයක් රියදුරුට පාලනය කර ගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන පෙරළීමෙන් මගීන් අනතුරක් සිදුව ඇත. අනතුරින් මාර්ගයේ ගමන්කළ පදික පුද්ගලයෙකු තුවාල ලබා රඹෑව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 34 ක් වූ කෑදෑව, අනුරාධපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය රඹෑව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. මිහින්තලය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**